

# දැනුමයි විනෝදයයි අංක 2

**එස්. බී. ආර්. නිකහැටිය ගෙන එයි.**


1. දවසක්ද එක ගොවියෙක් ඈත පොලකට ගියා, කුකුළෙකුයි, බල්ලෙකුයි, වී මල්ලකුයි අරගෙන, විකිණීමට. මේ පොලට යන්ඩ ගඟකිනුත් එගොඩ වෙන්න තිබුණා. නමුත් ගඟ අයිනට ආ විට එක වරකට එක සතෙක් හෝ වී මල්ල පමණක් රැගෙන යා හැකි කුඩා ඔරුවක් තිබෙනවා දැක ඔහුට ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. කුකුලයි බල්ලයි මෙගොඩ තබා වී මල්ල පමණක් මුලින්ම එගොඩ ගෙන ගියොත් බල්ලා කුකුලව කා දමනවා. කුකුලයි වී මල්ලයි එගොඩ තබා බල්ලා මුලින්ම ගෙනිච්චොත් කුකුලා වී කණවා. ලොකු ප්‍රශ්නයක් නේද?

නමුත් අවසානයේදී ගොවියා මේ එක එක දේ එගොඩ කරගෙන පොලට ගියා. කොහොමද එය කළේ?





2. හතරැස් කොටු දෙකක් පමණක් ඉතිරි වනසේ මේ පිංතූරයේ ඉරි අටක් මකන්නට පුළුවන්ද කියා බලන්න.



3. නැතිවන තිත—මේ පොත ඔබගේ ඇස් වලින් අඩියක් පමණ ඈතින් අල්ලා ගන්න. දකුණු ඇස වසා වම් ඇසෙන් X = දෙස බලා ගෙන සෙමින් පොත ඇස් ළඟට ගෙන එන්න. වම් ඇසෙන් X = දෙස බලා සිටියත් ඇස කොනෙන් කලු තිත පෙනෙනවා. නමුත් ක්‍රමයෙන් පොත ඇස් ළඟට ගෙනෙන විට එක් අවස්ථාවකදී කළු තිත නොපෙනී යනවා. මෙයට හේතුව ඔබ දන්නවාද?

විසඳුම: 51 පිට බලන්න.